**සූරියවැව ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**---------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 07 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | -------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේදී ළමා උද්‍යාන 02 ක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දැරූ රු. 299,895 ක පුනරාවර්තන වියදම ප්‍රාග්ධනිත කර තිබුණි. | පුනරාවර්තන වියදම් ප්‍රාග්ධනිත නොකළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී පුස්තකාලයක අංශ වෙන් කිරීම හා ග්‍රාමීය පුස්තකාලයක රාක්ක සකස් කිරීම වෙනුවෙන් දැරූ රු .235,199 ක වත්කම් වැඩි දියුණු කිරීමේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iii) | වෙනිවැල්ආර ගොඩනැගිල්ල වටා දැල්වැට ඉදිකිරීම සඳහා වැය කළ රු 78,023 .ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iv) | රුහුණු සංචාරක කාර්යංශයේ ප්‍රතිපාදන මත මදුනාගල උණුදිය උල්පත් පරිශ්‍රය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට එම කාර්යාංශයෙන් ලැබිය යුතු රු 1,624,244 .ක බිල්පත් වටිනාකම් හා ඉදි කිරීම් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

| | | | |
|---|---|---|---|
| (v) | සභා බල ප්‍රදේශයේ මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම වෙනුවෙන් ගෙවා තිබුණු රු 200,000 .ක ඉන්ධන වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු151 .,313,683 ක් වූ ගිණුම් විෂයයන් ක් 05සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විගණන ඡේදය පිළිගත් අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (1) 134 වගන්තිය | නව වරිපනම් බල ප්‍රදේශ හඳුනා ගෙන වරිපනම් බදු තක්සේරු කර අය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හඳුනාගත් දේපල තක්සේරු කිරීම සඳහා ලැයිස්තුවක් 2018 ඔක්තෝබර් 29 තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, එම කටයුතු අවසන් වීමෙන් පසුව 2020 වර්ෂයේ සිට වරිපනම් බදු අය කිරීමට කටයුතු කරමි |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 04 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඉන්ධන පරීක්ෂාව සිදු කරමි |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | සභාව සතු කඩ කාමර 10 කින් එක්වන් මුදල් රු. 337,592 ක් අයකර නොතිබූ අතර එම හිඟ ශේෂය තුළ 2011 ට පෙර හිඟ ශේෂය රු. 292,592 ක් විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම හිඟයෙන් අයකර ගත නොහැකි රු. 270,992 ක් කපා හැරීමට පළාත් පාලන කොමසාරිස් මගින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත 2017.02.28 දින යොමුකර ඇති අතර, සූරියවැව බස් නැවතුම්පොළ අයිතිය සභාව සතු නොමැති බැවින් කඩ කුලී රු. 21,600 ක් අයකර ගැනීමට නොහැකි වී ඇත. එම කඩ කාමරවල අයිතිය ලබා ගැනීමෙන් පසුව හිඟ මුදල් අයකර ගන්නා අතර, තවත් කඩ කාමර 02 කින් ලැබිය යුතු රු. 45,000 ක් අයකර ගැනීමට නොහැකි නිසා එම කඩ කාමර සභාව වෙත පවරා ගන්නා ලදී |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,762,304 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,072,724 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 831,000 | 911,710 | 914,460 | 15,350 | 1,115,000 | 813,030 | 810,180 | 18,100 |
| කුලී | 19,323,100 | 17,077,595 | 17,008,480 | 981,065 | 19,847,500 | 17,930,430 | 17,813,530 | 911,950 |
| බලපත්‍ර ගාස්තු | 1,229,100 | 1,283,599 | 1,309,049 | 1,750 | 1,164,200 | 1,058,871 | 1,031,671 | 27,200 |
| වෙනත් ආදායම් | 2,037,000 | 6,727,844 | 4,531,201 | 7,873,297 | 5,720,300 | 7,187,516 | 4,632,518 | 5,676,654 |
| එකතුව | 23,420,200 | 26,000,748 | 23,763,190 | 8,871,462 | 27,847,000 | 26,989,847 | 24,287,899 | 6,633,904 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු 32,634,652 .ක් වුවද, රැස්කරන ලද ආදායම රු23,763,190 වර්ෂය තුළ ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය 73% ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | විගණන ඡේදය පිළිගනිමි |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සූරියවැව බල ප්‍රදේශය තුළ පවත්වා ගෙන යන පෞද්ගලික ආයතනයකින් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම සභාව කසළ එකතු කළත් ඒ සඳහා ගාස්තුවක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | එම ආයතනයෙන් දැනට කසළ ලබා නොගන්නා අතර කසළ බදු ගෙවන්නේ නම් පමණක් කසළ ලබා ගන්නා බවට අදාළ ආයතනය දැනුවත් කරන ලදී |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයත් කඩ කාමර 36 කින් රු.826,950 ක කඩ කාමර කුලී හා රු.84,190 ක ප්‍රමාද ගාස්තු වශයෙන් එකතුව රු. 911,140 ක් අයවීමට තිබූ අතර එම ශේෂයෙහි හිග හිටි කාල පරාසය 20121 වර්ෂයත් 2018 වර්ෂයත් අතර විය. තවද එම හිග මුදල් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | අයවිය යුතු හිඟ මුදලින් රු. 251,405 ක් කපා හැරීමට විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යවා ඇති අතර ඉතිරි හිඟයෙන් රු. 20,225 ක් අයකර ගන්නා ලදී |

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 7,103,280 ක් හා රු.403,796 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | මෙම හිඟයෙන් රු. 2,500,000 ක් 2019 පෙබරවාරි 08 සභාවට ලැබී ඇති අතර ඉතිරි මුදල් එවන ලෙස ප්‍රධාන ලේකම් වෙතත් ආණ්ඩුකාරතුමා වෙතත් ඉල්ලීම් කරන ලදී |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මදුනාගල කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වටා විදුලි වැට ස්ථාපනය කිරීමේ කර්මාන්තය සඳහාප 2018 දෙසැම්බර් 10 දින රු.1,132,660 ක ඇස්තමේන්තුවක් මත ගිවිසුම් ගත වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කර්මාන්තය ආරම්භ කර නොතිබුණි. | අදාළ කර්මාන්තයන් ඉටු කළ යුතුවේ. | මේ සඳහා රු. 1,000,000 ක් පළාත් සභාවෙන් වෙන් කළද එම කර්මාන්තය ඉටු කිරීමට යාමේදී ඉඩම් හිමියන් හා සභාව අතර ගැටළුවක් ඇති වූ අතර ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශ ලබාගෙන නීත්‍යානුකූලව මෙම ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමි. විදුලි පරිපථ සවි කර මුරකුටිය සමඟ ගොඩනැගිල්ල පමණක් ඉදිකළ අතර වැට ගැසීමේ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් නොකරන ලදී |
| (ii) | වර්ෂය 2018 අයවැය ලේඛනය අනුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වූ සංවර්ධන යෝජනා 90 න් සංවර්ධන යෝජනා 25 ක් පමණක් ඉටුකර තිබුණි. | අයවැය ලේඛනයේ ඇතුළත් සංවර්ධන යෝජනා ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | සභිකයින් පත්වීමෙන් අනතුරුව ඔවුන් වෙත ලැබුණු මහජන අදහස්ද සැලකිල්ලට ගෙන බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කළ බැවින් අයවැය ලේඛනයේ සඳහන් වැඩ යෝජනා ඉටු කිරීමට නොහැකි විය |

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව විසින් රැස්කර තිබූ කසළ වෙන් කිරීමකින් තොරව අවිධිමත්ව මදුනාගල ප්‍රදේශයේ පිහිටි ඝණ අපද්‍රව්‍ය බැහැර කරන භූමියට බැහැර කර තිබුණි. | කසළ වෙන් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම භූමිය විවෘත භූමියක් බවත් විදුලි වැට ගැසීමට නොහැකි වීම නිසා පිටස්තර පුද්ගලයින්ද කසළ බැහැර කරන බවත්, වන අලි මෙම භූමිය අවට ගැවසෙන නිසා මුරකරුවෙකු යෙදිය නොහැකි බවත්, කසළ තැන් තැන්වල පවතින බව පිළිගන්නා බව සහ කසළ වෙන් කර, රැස්කර බැහැර කරන ඉඩමට ගෙන ගොස් වරින් වර යන්ත්‍ර යොදවා පස්වලින් යට කරන ලදී |
| (ii) | රැස් කරන දිරන කසළ භාවිතයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම 2018 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | කොම්පොස්ට් නිෂ්පාදනය කළ යුතුවේ. | ප්‍රතිපාදන ලද වහාම කොම්පොස්ට් ව්‍යාපෘතිය ආරම්භ කර කොම්පෝස්ට් නිෂ්පාදනය කළ හැක |
| (iii) | ප්‍රාදේශීය සභාව ඝණ අපද්රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා පාරිසරික නිර්දේශ ලබාගෙන තිබුණත් එහි ඇතුළත් කොන්දේසි 05ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ කොන්දේසි ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉඩම විධිමත්ව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගෙන ඇති අතර ඉඩම නිරවුල් වීම, විදුලි වැට ගැසීම හා දැල් වැට ගැසීම මගින් ප්‍රතිචක්‍රීකරණය නිවැරදිව සිදු කළ හැකි වේ. ප්‍රතිපාදන ලබා |

| | | |
|---|---|---|
| | | නොදීම නිසා එම ගැටළු මතු වී ඇති අතර ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව එම ගැටළුවලට විසඳුමක් ලබා දිය හැක |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන ය න්‍යාය 2030 හ යේ තිරසර සංවර්ධන අරමුණු සපත්‍ර ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් දේශයේ මහජනතාවගේ ජීවන සහා බල ප්‍ර නංවාලීම සඳහා තත්ත්වය සහ සෞඛ්‍ය වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | දිඝු කාලීන සැලසුම් සකස් කරන ලෙස සංවර්ධන නිලධාරීන් දැනුවත් කර ඇති අතර, එම සැලසුම් සකස් කර ඉදිරිපත් නොවීමෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 55 ක් හා 49 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 01 ක් හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව 07 ක් විය . | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පුරප්පාඩු 04 ක් සම්පූර්ණ කර ගැනීමට ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් කර ඇති අතර, රියදුරු පුරප්පාඩුව සඳහා ගැසට් කර සම්මුඛ පරීක්ෂණද පවත්වා ඇත. සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක් සඳහා සේවය අතහැර ගිය කම්කරුවෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇති අතර, අනෙකුත් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන අතර අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත දන්වන ලදී |
| (ආ) | ඉකුත් වර්ෂවලදී සභාවේ සේවයෙන් ඉවත්ව ගිය සේවකයින් 14 දෙනෙකුට අදාළව රු.46,230 ක සේවක ඇප මුදල් නිරවුල් කර නොතිබුණි. | සේවක ඇප නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | නිලධාරීන් ඉල්ලීමක් කර නොමැති අතර ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අප්‍රේල් 04 දින පෞද්ගලික ආයතනයකින් පරිගනක පද්ධති 04 ක් රු.720,000 ක ප්‍රතිෂ්ඨාවකට සභාව මිලදී ගැනීමට ගිවිසුම් ගත වී ඉන් රු.540,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණ ද එම පද්ධතීන්වල ක්‍රියාකාරීත්වය පහළ මට්ටමක පැවතුණි. | මෙම පද්ධති ප්‍රශස්ථ ක්‍රියාකාරී මට්ටමක පවත්වාගත යුතුවේ. | ගබඩා තොග පාලන පද්ධතියේ ගබඩා ලේඛන සකස් කිරීම, නිකුත් කිරීම සිදු කරයි. මානව සම්පත් හා පුද්ගලික ලිපි ගොනු පද්ධතියේ කාර්යය මණ්ඩලයේ සියලුම තොරතුරු ලබාගත හැකි අතර, රථ වාහන පද්ධතියේ වාහනවල වර්ගය, අංකය, ලියාපදිංචි අංකය ආදි ලෙස තොරතුරු ලබා ගත හැක |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අගෝස්තු මාසයේ සිට ගර්හිත 2016 තත්ත්වයේ පවතින කැබ් රථයක් අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම වාහන සභාවට පවරා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින අතර ලියාපදිංචි සහතිකය ලද පසු අපහරණය කිරීමට කටයුතු කරමි |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් සුසාන භූමි 31 ක අයිතිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | සුසාන භූමිවල අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි |
| (ආ) | සභාව සතු රු. 18,500,000 ක් වටිනා ඉඩම් 07 ක සහ රු. 38,225,000 ක් වූ ගොඩනැගිලි 11 ක නීත්‍යානුකුල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | බල ප්‍රදේශයේ සියලුම පොදු ඉඩම් පවරා දෙන ලෙස ආණ්ඩුකාරතුමා වෙත දන්වන ලදී |

### 3.5 ප්‍රසම්පාදනය

-------------

### 3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

සමාලෝචිත වර්ෂයේදී රු 500,000 .ක ඇස්තමේන්තුවක් මත 2018 දෙසැම්බර් 30 දින මරණාධාර සමිති 3 කට හා ගොවි සංවිධානයකට සභාවෙන් ද්‍රව්‍ය ලබාදීමේ පදනමින් සුසාන භූමි හතරක් වටා කම්බි වැට ගැසීමේ කර්මාන්තයට ගිවිසුම්ගත වීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගිවිසුමේ දින සිට සතියක් තුළ කර්මාන්තය නිම කළ යුතු වුවත් දින 18 ල්අප්‍රේ 2019 .වන විටත් ඉටු කර නොතිබුණි | ගිවිසුම පරිදි කටයුතු කළ යුතුවේ. | සුසාන භූමි 04 න් හත්පෝරුව, අන්දරවැව හා බැද්දේවැව සුසාන භූමිවල වැට ගසා අවසන් කර ඇත. |
| (ආ) | නිෂ්පාදිත දිනයේ (2018 දෙසැම්බර් 27 දින) සිට දින 90 ක සක්‍රීය කාලයක් පවතින සිමෙන්ති කොට්ට 26 ක් හා 2019 අප්‍රේල් 18 දින වන විටත් භාවිතා නොකිරීම මත ඒවායේ සක්‍රීය කාලය අවසන්ව තිබුණි. තවද මේ සඳහා දැරූ රු.25,480 ක වියදම අනාර්ථික වියදමක් විය. | සිමෙන්ති කොට්ට නියමිත කාලය තුළ ප්‍රයෝජනයට ගත යුතුවේ. | කල් ඉකුත් වූ සිමෙන්ති කොට්ට සඳහා වූ රු. 15,120 ක අලාභය අදාළ සමිතියෙන් අයකරන ලදී. |
| (ඇ) | ගිවිසුම කඩ කළ උක්ත සමිති හා සංවිධාන අසාධු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අසාධු ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1** **අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික අයවැයෙන් වෙන්කළ රු. 10,000 ක් ඉක්ම වූ වැය විෂයයන් 09 ක් සඳහා වෙන්කර තිබූ එකතුව රු. 7,720,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළදී වැයකර නොතිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | වර්ෂය තුළ වැය වෙතැයි අපේක්ෂිත කාරණා සඳහා මුදල් වෙන් කළ අතර, සමහර කාර්යයන් ඉටු නොකිරීම හා ආදායම් ලෙස ඇස්තමේන්තු කළ මුදල් නොලැබීමත්, කර්මාන්ත ඉටු කිරීම සඳහා මුදල් නොලැබීම නිසාත් මෙම වියදම් දැරීමට නොහැකි විය |
| (ආ) | වියදම් විෂයයන්0 4 ක එකතුව රු . 35,383,901 ක් වූ ඉතිරිවීම් පැවති අතර එය සියයට 29 සිට සියයටක පරාසයක 100 .විය | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | විගණන ඡේදය පිළිගනිමි. |